# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (දහනව වන කණ්ඩායම)
# ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව(අට වන කණ්ඩායම)- 2024

## 01 ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

**පාඨමාලා සංයුතිය :**

- ඉංග්‍රීසි සාහිත්‍යය - I - කාව්‍ය සහ නාට්‍ය (English Literature : Poetry and Drama)
- ඉංග්‍රීසි සාහිත්‍යය - II - නවකතා සහ කෙටි කතා (English Literature : Fiction - Novels and Short Stories
- ඉංග්‍රීසි භාෂාව - I - උසස් ලේඛනය හා කියවීම (Advanced Writing and Reading)
    - අ. අධ්‍යයන කටයුතු සඳහා ලේඛනය (Writing for Academic Purposes)
    - ආ. වාණිජ්‍ය හා පරිපාලන කටයුතු පිළිබඳ ලේඛනය (Writing for Business & Administratrative Purposes)
- ඉංග්‍රීසි භාෂාව - II - උසස් ව්‍යාකරණය (Advanced Grammar)
- ඉංග්‍රීසි භාෂාව - III - සවන් දීම සහ කථනය (Speech and Listening)
- බෞද්ධ සාහිත්‍යය (Buddhist Literature)
- බුදු දහමේ මූලික ඉගැන්වීම් (Fundamental Teachings of Buddhism)

**පාඨමාලා :**

- සහතික පත්‍ර පාඨමාලා (සති අන්ත)
    1. ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව
    2. ඉංග්‍රීසි උසස් සහතික පත්‍ර පාඨමාලාව
- ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (සති අන්ත)

**ඇතුළත් වීමේ සුදුසුකම :**

ඉංග්‍රීසි විෂය සහිතව අ.පො.ස (සා.පෙළ) සමත් වීම.

**ශ්‍රේණිගත කිරීම :**

ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව මත සිසුන් අදාළ පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

**පාඨමාලා ආරම්භය :** 2024 ජනවාරි

**පාඨමාලා කාලය -** සෑම පාඨමාලාවකම කාලය වසර එකකි
සෑම සෙනසුරාදා දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා

**පාඨමාලා ගාස්තු :**

| | | |
|---|---|---|
| සහතික පත්‍ර පාඨමාලාව | - | රු. 20,000/- |
| උසස් සහතික පත්‍ර පාඨමාලාව | - | රු. 25,000/- |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | - | රු. 32,500/- |

## ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය :

2024.01.28 යන දින ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ බාහිර විභාග මධ්‍යස්ථානය, 214, බෞද්ධාලෝක මාවත, කොළඹ-07. පරිශ්‍රයේ දී පවත්වනු ලැබේ.

## 02 ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව

## පාඨමාලා සංයුතිය :.

- ව්‍යාකරණය (Grammar)
- සාහිත්‍යය (Literature)
- රචනය හා කියවීම (Written Composition & Reading )
- සවන්දීම සහ කථනය (Listening & Speech)
- බෞද්ධ මූලධර්ම හා සමකාලීන සමාජ අධ්‍යයනය (Buddhist Principles and Contemporary Social Issues)

**ඇතුලත් වීමේ සුදුසුකම :**

- විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් ආයතනයකින් **ඉංග්‍රීසි ඩිප්ලෝමාවක්** ලබා තිබීම

  හෝ
- අ.පො.ස (උසස් පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා **බී** සාමර්ථ්‍යය ලබා තිබීම

  හෝ
- අ.පො.ස (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා **බී** සාමර්ථ්‍යය ලබා තිබීම

**තෝරා ගැනීම**

සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනේ.

**පාඨමාලා කාලය :** කාලය වසර එකකි

**පාඨමාලා ආරම්භය : 2024 ජනවාරි**

ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව : සෑම සෙනසුරාදා දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා

**පාඨමාලා ගාස්තු :** ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව - රු. 42,000/-

**(පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ ලියාපදිංචි වන අවස්ථාවේදී ය)**

tamilguru.lk

**විශ්වවිද්‍යාලය වෙත මේ සම්බන්ධව ගෙවූ කිසිදු මුදලක් ආපසු නොගෙවනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

**අයදුම්පත් ලබාගත හැකි ආකාරය** :

දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත 2023.11.08 දින දක්වා ප.ව. 3.00 ට පෙර අංක **214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයට** ඉදිරිපත් කිරීමෙන් අයදුම්පත් හා විස්තර ලබා ගත හැකි ය.

තැපැල් මගින් අයදුම්පත් හා විස්තර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි **රු. 500/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද 9″x 4″ ප්‍රමාණයේ රු. 110/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකි ය.

**චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **පාඨමාලාවේ නම සඳහන් කර - "අයදුම්පත්‍ර ලබා ගැනීම යනුවෙන්"** සඳහන් කළ යුතු ය.

**සහකාර ලේඛකාධිකාරී,**
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 214, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය.

**සැ.යු.** එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට 'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය' නමින් රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග ඉදිරිපත් කළ යුතු ය.

**බැංකුවට මුදල් ගෙවීමේ දී තමාගේ නමට ඉදිරියෙන් "E/Dip "යන සංකේත අංකය භාවිතා කළ යුතුය.**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2023 නොවැම්බර් මස 15** වන දින වේ. එදිනට පෙර නිසියාකාර ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් උක්ත ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. **අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වැඩි විස්තර: 011-2580609,**
**ඉංග්‍රිසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශයේ අංශාධිපති : 071-3109225**
**පාඨමාලා සමායෝජක : 071-3109225**

**ලේඛකාධිකාරී (වැ.බ)**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 214, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**